**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය - 2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ආදායම් යටතේ ඇතුළත් කළ යුතු වේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය වෙත රජයෙන් ලද රු.771,040ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ආදායම් යටතේ ඇතුළත් නොවීමෙන් වර්ෂයෙහි ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රමිත අංක 11 අනුව රු.771,040ක වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ඇතුළත්කර නොතිබුණු අතර, 2025 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී නව ප්‍රමිතය අනුව කටයුතු කරන බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි ප්‍රමිත අනුගමනය කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අනෙකුත් ලැබීම් ලෙස රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානවලින් රු.2,323,360ක් ක්‍රමක්ෂය ලෙස ඇතුළත්කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයෙහි ආදායම වැඩිවී තිබුණි. | මෙයට හේතුව ප්‍රමිතයේ බලපෑම බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි ප්‍රමිත අනුගමනය කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් තුළ වර්ෂයේ ඌණතාවයට එකතුකරන ලද වර්ෂයට අදාළ රු.12,629,649ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය වටිනාකම තුළ රු.2,323,360ක් වූ රජයෙන් ලද | මෙයට හේතුව ප්‍රමිතයේ බලපෑම බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි ප්‍රමිත අනුගමනය කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය ඇතුළත් කිරීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද වටිනාකම රු.2,323,360ක් වැඩියෙන් සඳහන් වී තිබුණි. | | |
| (ඇ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අනෙකුත් ආදායම්වල නිවැරදි අගය පෙන්නුම් නොකිරීම හේතුවෙන් වර්ෂයෙහි ඌණතාවය රු.1,552,320ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි වැඩියෙන් දක්වා තිබුණි. | මෙයට හේතුව ප්‍රමිතයේ බලපෑම බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි ප්‍රමිත අනුගමනය කිරීමට කටයුතු කළ යුතු ය. |

**1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීතිරීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 315, 880 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදය | චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතුකර නොතිබුණි. | ඇප තැන්පත් කිරීමට අදාළ සියලුම නිලධාරීන්ගේ ගිවිසුම් මේ වන විට රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි. | අදාළ නිලධාරීන් ඇප තැබීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2022 අගෝස්තු 22 දිනැති අංක පීඊඩී 05/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.9 ඡේදය | විදේශගත වන සෑම නිලධාරියෙකු විසින්ම මෙරට බැංකු පද්ධතිය හරහා තමාගේ නමින් ආරම්භ කරන ලද එක් අනේවාසික විදේශ මුදල් ගිණුමකට මාසිකව මුදල් ප්‍රේෂණය කළ යුතු ය. මෙම මුදල් ප්‍රේෂණය කිරීම සඳහා මාස 02ක සහන කාලයක් ලබාදෙන අතර, මාස දෙක අවසන් වූ වහාම අදාළ ප්‍රේෂණය ආරම්භ කළ යුතු වුව ද, 2023 පෙබරවාරි මස විදේශගත වූ අධිකාරියෙහි රියදුරෙකු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මුදල් ප්‍රේෂණය | විදේශ මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් නිලධාරියාගේ ජොෂ්ඨතාවය පහත දමා කටයුතු කිරීමට කළමනාකරණ මණ්ඩලය විසින් තීරණයක් ගෙන ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විදේශ මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

කිරීමට කටයුතුකර
නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,059,513 ඌණතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.22,583ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,082,096ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් ආදායම් රු.3,915,400 අඩුවීම, පුද්ගලික පඩිනඩි රු,5,665,895කින් හා ගිවිසුම්ගත සේවා රු.4,500,673කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) පසුගිය වර්ෂයෙහි ගොඩනැගිලි සහ සවිකිරීම් වෙනුවෙන් රු.222,000ක් වැයකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයෙහි ඒ සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. එමෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පසුගිය වර්ෂයෙහි. රු.224,000ක් දරා තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි. ඒ අනුව මෙම සත්‍ය වියදමෙහි සියයට සියයක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) පසුගිය වර්ෂයෙහි කාර්යමණ්ඩලය පුහුණුකරවීම් සඳහා රු.272,000ක් වැයකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයෙහි ඒ සඳහා රු.301,000ක් වැයකර තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ සත්‍ය වියදමෙහි සියයට 11ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඇ) පසුගිය වර්ෂයෙහි පුද්ගලික පඩිනඩි සඳහා රු.33,696,000ක් වැයකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයෙහි ඒ සඳහා රු.40,008,000ක් දරා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ සත්‍ය වියදමෙහි සියයට 19ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඈ) එමෙන්ම ගමන් වියදම් සඳහා පසුගිය වර්ෂයෙහි රු.270,000ක් දරා තිබූ අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂයෙහි රු.485,000ක් දරා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ සත්‍ය වියදමෙහි සියයට 80ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඉ) සේවාවන් සඳහා පසුගිය වර්ෂයෙහි රු.2,738,000ක් දරා තිබූ අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂයෙහි රු.3,359,000ක් දරා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ සත්‍ය වියදමෙහි සියයට 23ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඊ) සැපයුම් වියදම් සඳහා පසුගිය වර්ෂයෙහි රු.3,676,000ක් දරා තිබූ අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂයෙහි රු.3,436,000ක් දරා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ සත්‍ය වියදමෙහි සියයට 7ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(එ) අලුත්වැඩියා වියදම් සඳහා පසුගිය වර්ෂයෙහි රු.3,833,000ක් දරා තිබූ අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂයෙහි රු.3,295,000ක් දරා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ සත්‍ය වියදමෙහි සියයට 14ක අඩුවීමක් නිරීක්ෂණය විය

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 අංක 4 දරන පනතේ13(1)(ඊ) උපවගන්තිය ප්‍රකාරව පනතේ 29 වන වගන්තිය යටතේ හා 2023 අංක 10 දරන පනතේ 40(1)(ඈ) වගන්තිය යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු වුව ද, අධිකාරිය පිහිටුවා වර්ෂ 8ක් ගත වුව ද, ඒ අනුව කටයුතුකර නොතිබුණු අතර, මෙම අරමුදලෙහි 2024 දෙසැම්බර් 31 දිනට රු.26,440,018ක ශේෂයක් පැවතුණි. | අමාත්‍යවරයා විසින් තාවකාලික ප්‍රදාන සඳහා වන මණ්ඩලයක් පනත ප්‍රකාරව පත්කර ඇති අතර, එම මණ්ඩලය විසින් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර, එම යෝජනා ක්‍රමය ප්‍රකාරව වන්දි ඉල්ලීම්කර ඇති වින්දිතයන් අතරින් වන්දි ගෙවිය යුතුයැයි මණ්ඩලය තීරණය කළ වින්දිතයන් සඳහා වන්දි ගෙවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව වන්දි ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරී පනතේ 29 වගන්තිය යටතේ පිහිටුවන ලද ආරක්ෂණ අරමුදලට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ රැස්කළ දඩමුදල් පිළිවෙලින් රු.1,495,585ක් හා රු.2,876,775ක් වූ අතර, පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ වියදම් ලෙස පිළිවෙලින් රු.162,086ක් හා රු.251,025ක් ගෙවා තිබුණි. ආරක්ෂණ අරමුදලේ ප්‍රධාන වියදම් ලෙස එකී පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව ගෙවන වන්දි සලකන බැවින් සහ පනතේ 2(ඇ) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන්ට එරෙහිව වරදක් සිදුකිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගේ වින්දිතයන් හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම අධිකාරියේ අරමුණක් වුව ද, අධිකාරිය විසින් ඉහත ආකාරයට ආදායම් රැස්කිරීම කළ ද, වන්දි ගෙවීමට නිසියාකාර ක්‍රමවේදයක් සකස්කර නොතිබීම නිසා වන්දි ගෙවීම සැළකිය යුතු ලෙස අඩු වී තිබුණි. | අමාත්‍යවරයා විසින් තාවකාලික ප්‍රදාන සඳහා වන මණ්ඩලයක් පනත ප්‍රකාරව පත්කර ඇති අතර, එම මණ්ඩලය විසින් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර, එම යෝජනා ක්‍රමය ප්‍රකාරව වන්දි ඉල්ලීම්කර ඇති වින්දිතයන් අතරින් වන්දි ගෙවිය යුතුයැයි මණ්ඩලය තීරණය කළ වින්දිතයින් සඳහා වන්දි ගෙවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව වන්දි ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු ය. |

### 3.2 අරමුදල් ඌණ උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දී අධිකාරියට මූලධන වියදම් සඳහා මධ්‍යම රජයෙන් ලැබූ රුපියල් මිලියන 2.200ක මුදලින් වර්ෂය තුළ දී රුපියල් මිලියන 0.791ක් වියදම්කර තිබූ අතර, රුපියල් මිලියන 1.709ක් එනම් සියයට 78ක මුදලක් ඉතිරිවී තිබුණි. | 2024 වර්ෂය තුළ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ JURE ව්‍යාපෘතියෙන් ලබාදුන් අරමුදල්වලට අදාළ, ක්‍රියාකාරකම් සිදුකළ නිසා රජයේ ප්‍රතිපාදන යටතේ කිරීමට සැලසුම්කළ ක්‍රියාකාරකම් සඳහා කාලය අවම වූ බව දන්වා තිබුණි. | අරමුදල් නිසියාකාරයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.11.1(ඇ) ඡේදය අනුව ප්‍රසම්පාදන කාලසටහන, ප්‍රසම්පාදන ක්‍රමය සහ ලංසු කැඳවීමේ ලේඛන වර්ග පිළිබඳව එකඟවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඒකාබද්ධ පළමු රැස්වීමක් පවත්වනු ලැබිය යුතු වුව ද , රුපියල් මිලියන 2.01ක් වටිනා උපකරණ මිලදීගැනීමට අදාළ ප්‍රසම්පාදනයේ දී එවැනි රැස්වීමක් නොපවත්වා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන ක්‍රමය සහ මිලගණන් කැඳවීමට අපේක්ෂිත ආයතන පිළිබඳව තීරණයකර ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත්කර තිබුණි. | විගණනය පෙන්වා දී ඇති ආකාරයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන්කර ගත් බව දන්වා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු ය. |
| (ආ) | එම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.12 (අ) අනුව ප්‍රසම්පාදන කමිටුවල සහ තාක්ෂණික කමිටුවල සියලු සාමාජිකයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ආකෘතිපත්‍රය ප්‍රකාරව ප්‍රකාශයක් අත්සන්කළ යුතු වුව ද, ඉහත උපකරණ මිලදීගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාව සඳහා පත්කර ඇති කමිටුවල සාමාජිකයන් විසින් එවැනි ප්‍රකාශයක් අත්සන්කර නොතිබුණි. | එවැනි මිලදීගැනීමක් සිදුකළ ප්‍රථම අවස්ථාව වන බැවින් ඒ පිළිබඳව යම් අතපසුවීමක් සිදුව ඇති බව පිළිගන්නා අතර, ඉදිරියේ දී විගණනය පෙන්වා දී ඇති ආකාරයට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | එම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.9.1(ආ) ඡේදය අනුව රු. 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත්, උපකරණ මිලදීගැනීමට අදාළ ප්‍රසම්පාදනය වෙනුවෙන් කොන්ත්‍රාත්තුවක් අත්සන්කර නොතිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවල දී රු.500,000 ඉක්මවන භාණ්ඩ මිලදීගැනීම්වල දී විගණනය පෙන්වා දුන් ආකාරයට කටයුතු කිරීමට සටහන් කරගත් බව දන්වා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන්කළ යුතු ය. |

**3.4 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදල්වලට අදාළව සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව අධිකාරිය කටයුතු කිරීමට අපොහොසත්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රුපියල් මිලියන 1.412ක මුදලක් නැවත අරමුදලට මාරුකර තිබුණි. | මෙම සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපාදනවලින් සැලසුම් කළ වැඩසටහන් සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී තරමක් ඉහළ මිලගණන් මෙන්ම ප්‍රමිතියෙන් ඉහළ පහසුකම් සහිත ස්ථාන පාදක කරගත් නමුත්, රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛ ප්‍රකාරව බොහෝ වැඩසටහන් රජයට අනුමත ස්ථාන තුළ පැවැත්වීමට කටයුතු කිරීම නිසා සත්‍ය වියදම අඩුමට්ටමක පැවති බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ආ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන් 12ක් සඳහා රුපියල් මිලියන 7.502ක් ඇස්තමේන්තුකර තිබූ අතර, ඒ සඳහා සත්‍ය වියදම ලෙස රුපියල් මිලියන 5.407ක් වැයකර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුව හා සසඳන කළ රුපියල් මිලියන 2.095ක් එනම් සියයට 28ක් ඉතිරි වී තිබුණි. | මෙම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපාදනවලින් ඉතිරි වූ සියයට 21ක ප්‍රමාණය එලෙස නොවීමට ඉදිරියේ දී වගබලා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | වින්දිතයන් හා සාක්ෂිකරුවන් පිළිබඳව තොරතුරු ලබාගැනීම සඳහා කළුතර, මොණරාගල හා අම්පාර ප්‍රදේශ මුල්කර ගනිමින් සමීක්ෂණයක් සිදුකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී රුපියල් මිලියන 1.429ක් ඇස්තමේන්තුකර තිබූ අතර, ඉන් රුපියල් මිලියන 0.550ක් වැයකර තිබුණි. ඒ | මෙම ක්‍රියාකාරකම සඳහා ඇස්තුමේන්තු නිසියාකාරව පිළියෙලකර නිශ්චිත කාලරාමුවක් සකස්කර තිබුණ ද, විවිධ හේතු මත ක්ෂේත්‍ර සමීක්ෂණය ප්‍රමාදවීම් 2023 වර්ෂයේ සිටම සිදු වූ අතර, ක්ෂේත්‍ර සමීක්ෂණය 2024 මාර්තු වන විට අවසන්කරන ලදී. පුරවන ලද සියලුම ප්‍රශ්නාවලීන් 2024 | අරමුදල් නිසියාකාරව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| අනුව මෙහි භෞතික ප්‍රගතිය සියයට 50ට වඩා අඩුමට්ටමක පැවති අතර, ඇස්තමේන්තු කරන ලද මුදලින් රුපියල් මිලියන 0.879ක් එනම් සියයට 61ක මුදලක් ඉතිරි වී තිබුණි. එසේම ව්‍යාපෘතිය නියමිත වේලාවට නිමකිරීමට නොහැකිවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට වෙන්කරන ලද මුදලින් රුපියල් මිලියන 0.526ක මුදලක් නැවත අරමුදල වෙත ගෙවා තිබුණි. | අගෝස්තු වන විට කේතනයකර දත්ත සමුදායකට ඇතුළත්කර ඇති අතර, දත්ත විශ්ලේෂණය සහ වාර්තාව සම්පාදනය සඳහා රුපියල් මිලියන 1.6ක මුදලකට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ලබාදීමට 2024 දෙසැම්බර් මාසයේ දී රැස් වූ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, ඒ අනුව මෙම ක්‍රියාකාරකම රුපියල් මිලියන 1.6ක් මගින් ඉදිරියේ දී කිරීමට බලාපොරොත්තු වන බව දන්වා තිබුණි. | |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යමණ්ඩලය 56 ක් වුව ද, එදිනට තථ්‍ය කාර්යමණ්ඩලය 38කින් සමන්විත වූ අතර, අධිකාරියෙහි පරිපාලන කටයුතු වෙනුවෙන් සෘජුවම දායකවන තනතුරු 34කින් තනතුරු 15ක් පුරප්පාඩුව පැවතුණි. අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අධිකාරිය ආරම්භ කළ 2017 වර්ෂයේ සිට මේ දක්වා ස්ථිර නිලධාරියෙකු පත්කර නොමැතිවීම හේතුවෙන් කාර්යාල කටයුතු කරගෙන යාමේ දී එය මහත් බාධාවක් වී තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබාගැනීමට අදාළ තොරතුරු කැබිනට් අනුකමිටුව වෙත ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදලින් සහ රජයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ එකතුව රුපියල් මිලියන 4.5ක ක්‍රියාකාරකම් හයක් වර්ෂය තුළ ක්‍රියාවට නංවා නොතිබුණි. | විවිධ හේතූන් නිසා මෙම කාර්යයන් ක්‍රියාවට නැංවීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අරමුදල්වලට අදාළව සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණු ක්‍රියාකාරකම් 03ක් සඳහා අරමුදල්වලින් රුපියල් මිලියන 1.001ක් වැයකර තිබූ අතර, මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ලබාගත් එකඟතාවය පිළිබඳ තොරතුරු ඉදිරිපත්කර නොතිබුණි. | මෙම ක්‍රියාකාරකම් 03 සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ එකඟතාවය සඳහා යවන ලද විද්‍යුත් තැපැල් සඳහා වාචිකව පිළිතුරු ලබාදුන් බවත්, මෙම වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කොට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගත් බවත්, දන්වා තිබුණි. | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. |